ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | : 2019 සැප්තැම්බර් 19 |

## සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී

ඉහත කී සමාගම සම්බන්ධව ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2019 සැප්තැම්බර් 08 සහ 09 දිනැති පුවත්පත් නිවේදන මගින් දැනුම් දෙන ලදී. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගම විසින් එහි ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ සැලැස්මක් ඉදිරිපත් කර ඇති අතර තැන්පත්කරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් නියම කරන ලද්දා වූ කාල රාමුවක් තුල එම ප්‍රාග්ධන වර්ධනය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය වෙත අවස්ථාවක් ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර ඇති බව දන්වා සිටීමට කැමැත්තෙමු.